*සැ. යු.*– මෙවර *ගැසට් පත්‍රයේ* V කොටසේ 2001 වර්ෂයේ මුද්‍රිත පොත් නාමාවලියේ ජනවාරි - මාර්තු, කාර්තුව ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,484 - 2007 පෙබරවාරි 09 වැනි සිකුරාදා - 2007.02.09**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ජේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 96 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 98 |
| රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 99 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 පෙබරවාරි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 පෙබරවාරි මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - මාතර

### රාජසන්තක හා හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මාතර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2007.03.10 දින පෙ. ව. 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසියෙහි ඇති යම් භාණ්ඩයක් විකිණීම සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් ඇත්නම් එම වෙන්දේසිය පැවැත්වීමට ප්‍රථම මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කල යුතුය. වෙන්දේසිය පැවැත්වීමට පැය 1/2 කට ප්‍රථම මෙම භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි අතර වෙන්දේසිය පැවැත්වෙන අතරතුර භාණ්ඩ පරීක්ෂා කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අධිකරණයට පිළිගත හැකි අවම ලන්සුවකට නොගැනෙන භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයේ අභිමතය පරිදි හැකි වේ.

භාණ්ඩ මිළදී ගන්නන් එවලේම මුදලින් මිළ ගණන් ගෙවිය යුතු අතර ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කල යුතු වේ. චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

භාණ්ඩ එදිනම අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු වේ.

රොහාන් ජයවර්ධන,
මහෙස්ත්‍රාත්/ අති. දිසාවිනිසුරු,
මාතර.

2007 ක්වූ ජනවාරි මස 04 වැනි දින,
මාතර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියට නියමිත භාණ්ඩ

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | ඒආර් 2231/06 | - අංකය අපහැදිලි පාපැදිය |
| 02. | ඒආර් 2232/06 | - රැලේ වර්ගයේ පාපැදිය |
| 03. | ඒආර් 2230/06 | - අංකය අපහැදිලි මවුන්ටන් පාපැදිය |
| 04. | ඒආර් 2545/06 | - වයි 337074 දරන පාපැදිය |
| 05. | ඒආර් 2546/06 | - එච් 3393751 දරන පාපැදිය |
| 06. | ඒආර් 2547/06 | - අංකය හා වර්ගය අපහැදිලි පාපැදිය |
| 07. | ඒආර් 2548/06 | - අංකය හා වර්ගය අපහැදිලි පාපැදිය |
| 08. | ඒආර් 2565/06 | - අංක රහිත පාපැදිය |
| 09. | ඒආර් 2826/06 | - අංක 55631597 දරන පාපැදිය |
| 10. | ඒආර් 2825/06 | - පාපැදියක් |
| 11. | ඒආර් 2827/06 | - 57980 දරන පාපැදිය |
| 12. | ඒආර් 2997/06 | - අංකය රහිත පාපැදිය |
| 13. | ඒආර් 2995/06 | - අංක රහිත පාපැදිය |
| 14. | ඒආර් 2996/06 | - අංක රහිත පාපැදිය |
| 15. | ඒආර් 2999/06 | - පාපැදියක් |
| 16. | ඒආර් 3000/06 | - පාපැදියක් |
| 17. | ඒආර් 3002/06 | - පාපැදියක් |
| 18. | ඒආර් 3004/06 | - 68240207 දරන පාපැදියක් |
| 19. | ඒආර් 2998/06 | - අංකය අපහැදිලි පාපැදිය |
| 20. | ඒආර් 3001/06 | - අංකය අපහැදිලි පාපැදිය |
| 21 | ඒආර් 3003/06 | - 1. අංකය අපහැදිලි පාපැදිය<br>2. අංකය අපහැදිලි පාපැදිය<br>3. අංකය අපහැදිලි පාපැදිය |
| 22. | ඒආර් 3101/06 | - අංක 0072392 දරන පාපැදිය |
| 23. | ඒආර් 3100/06 | - ජේ. 627344 දරන පාපැදිය |
| 24. | ඒආර් 3099/06 | - පාපැදියක් |
| 25. | ඒආර් 3102/06 | - අංක155517350 දරන පාපැදියක් |
| 26. | ඒආර් 3104/06 | - සී. සී. එල්. 4940 දරන පාපැදියක් |
| 27. | ඒආර් 3127/06 | - අංක අපහැදිලි පාපැදිය |
| 28. | ඒආර් 3190/06 | - පාපැදියක් |
| 29. | 41608 | - එස්. පී. පී. ජේ. 1493 දරන ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 30. | 515 | - යන්මාර් වර්ගයේ අංක 900359 දරන ට්‍රැක්ටරය හා ට්‍රේලරය |
| 31. | බී. ආර්. 261/06 (29172) | - එන්ජින් 1142211 හා චැසි අංක සී. එජ්. 11/ 34545 දරන ට්‍රැක්ටරය |
| 32. | 19437 | - අංක 52-2910 දරන ට්‍රක් රථය |
| 33. | 15729 | - අංක 26 ශ්‍රී 3145 දරන ලොරි රථය |
| 34. | 22315 | - එස්. පී. ජේ. යූ. 2518 දරන ට්‍රැක්ටරය සහ ට්‍රේලරය |
| 35. | 47714 | - විදුලි හීටරයක් |
| 36. | 96957 | - වේන්ෂෝ යන්ත්‍රය |
| 37. | 49633 | - ගෑස් ලිපක් හා ගෑස් සිලින්ඩරයක් |
| 38. | අංක රහිත | - ගෑස් සිලින්ඩරයක් |
| 39. | ඒ. ආර්. 1983/06 | - ස්කුරුප්පු නියනක් |
| 40. | 43563 | - සවලක් |
| 41. | 43564 | - කුඩයක් |
| 42. | 46212 | - සවලක් හා තාච්චියක් |
| 43. | 37722 | - කුඩයක් |
| 44. | 37723 | - කුඩයක් |
| 45. | 37721 | - කුඩයක් |
| 46. | 42845 | - කුඩ එකයි |
| 47. | 42846 | - කුඩ දෙකයි |
| 48. | 47148 | - කුඩ දෙකයි |
| 49. | 47149 | - තරාදි එකයි<br>- තරාදි පඩි දෙකයි<br>- මේස පිහි එකයි<br>- අත් පොරව එකයි |
| 50. | 36005 | - තරාදි එකයි, පඩි එකයි |
| 51. | 32297 | - පෙට්‍රල් ලාම්පු එකයි |
| 52. | ඒ. ආර්. 256/06 | - වතුර මෝටරයක් |
| 53. | නඩු අංක රහිත | - බෝතල් තොගයක් |
| 54. | නඩු අංක රහිත | - ප්ලාස්ටික් ලොකු කුඩා කෑන් තොගයක් |
| 55. | 33276 | - ඩීසල් ලීටර් 15 ක් අඩංගු බූලි එකයි<br>- ඩීසල් අඩංගු බෝතල් 03 යි |
| 56. | 33686 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 57. | ඒ. ආර්. 206/06 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 58. | 38049 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 59. | 36000 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 60. | 38811 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 61. | 40950 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 62. | 40951 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 63. | 41082 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 64. | 42058 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 65. | 42755 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 66. | 42899 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 67. | 43516 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 68. | 46653 | - රවුම් කියත සහිත ලී ඉරන මේසය |
| 69. | 41410 | - අංක 109-6973 දරන යතුරු පැදිය |
| 70. | 35335(බී. ආර්. 959/06) | - අංක 48-4472 දරන ට්‍රක් රථය |
| 71. | ඒ. ආර්. 1986/06 | - කුඩා පෙන්ඩන්ට් 01 යි |
| 72. | ඒ. ආර්. 1292/06 | - අඟල් 4 1/2 ක් පමණ දිග ඇති රන් පැහැති චේන් පටක් |
| 73. | ඒ. ආර්. 1161/06 | - ජංගම දුරකථන 02 ක් |

02-316

---

මගේ අංකය : මග/මළ/න.භා/වෙන්දේසි.

## මහේස්ත්‍රාත් අධිකරණය - මහනුවර - 2007

### රාජසන්තක කරනු ලැබ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ වෙන්දේසිය

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක වලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් ද්‍රව්‍යයන් 2007.02.24 දින. පෙ. ව. 9.00 ට මහනුවර මහේස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන සියලුම ද්‍රව්‍යයන් පිළිබඳ හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය වෙත ලියවිල්ලක් මගින් ඉදිරිපත් කල යුතුය. එවිට ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලැබ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භායගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිලිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමෙ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේම මුදල් ගෙවා එදිනම පස්වරු 4.00 ට පෙර එම ද්‍රව්‍ය අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කල යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ භාණ්ඩ මිළදී ගැනීමට පැමිණෙන සියලුම දෙනා පුද්ගලයින් ලියාපදිංචි කිරිමේ හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

07. උපලේඛනය මෙයට අමුණා ඇත.

හර්ෂ සේතුංග,
මහේස්ත්‍රාත්,
මහනුවර.

2007 ජනවාරි මස 16 වැනි දින,
මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ දි ය.

### උපලේඛනය

| අනු අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 01. | ඒආර් 75385 | මන්නා පිහිය |
| 02. | ඒආර් 79616 | මන්නා පිහිය |
| 03. | ඒආර් 61429 | පිහි එකයි |
| 04. | ඒආර් 75384 | කැති එකයි |
| 05. | ඒආර් 60704 | මේස පිහිය, අත් පොරව |
| 06. | ඒආර් 71545 | මෝල්ගස් එකයි |
| 07. | ඒආර් 78081 | උකුනු ගස් එකයි |
| 08. | ඒආර් 60995 | ප්ලැට් ස්කුරුප්පු නියන, කටර් අඬුව |
| 09. | ඒආර් 62051 | යකඩ සේප්පුව |
| 10. | ඒආර් 44995 | යකඩ කපන කියත |
| 11. | ඒආර් 61361 | කලුපාට බිත්තියේ එල්ලන දුරකථනය |
| 12. | ඒආර් 60703 | සුදුපාට ප්‍රධාන පහන, මඩ ආවරණ දෙකයි, ඉදිරිපස සංඥා පහන |
| 13. | ඒආර් 60325 | 25.50 එම් දිග කලු වයර් රෝල් 1යි, 250 එම් දිග කම්බි රෝල් එකයි. කැලි 3 විදුලි පන්දම |
| 14. | ඒආර් 73349 | සෙන්ට්‍රක් වර්ගයේ වතුර මෝටරය |
| 15. | ඒආර් 77745 | රිම් එක සහිත අමතර රෝදය |
| 16. | ඒආර් 78900 | ඉමිටේෂන් වලලු 08 යි<br>ඉමිටේෂන් කරමාල 1 යි<br>ඉමිටේෂන් සාරි කටු 08 යි<br>අගස්ති මාල 03 යි.<br>හවඩි 4 යි.<br>කලුපාට හම් බෑග් 1 යි |
| 17. | ඒආර් 75936 | වෝල්ට් 12 බැටරිය |
| 18. | ඒආර් 77994 | බයිසිකල් චේන් 1 යි |
| 19. | ඒආර් 77452 | කම්බි තොගයක් |
| 20. | ඒආර් 59920 | මෝටරය සහ ගිනිගල |
| 21. | ඒආර් 62052 | වයර් රෝල් 01යි |
| 22. | ඒආර් 50298 | රෙදි අඩංගු මල්ල |
| 23. | ඒආර් 75416 | උදැල්ල |
| 24. | ඒආර් 70078 | කැති 02 යි, උදලු 1 යි, පොරෝ 1 යි |
| 25. | 67855 | සවල් 1යි, තාච්චු 01යි |
| 26. | 67854 | සවල් 1යි |
| 27. | 67851 | සවල් 1යි |
| 28. | 67850 | සවල් 1යි |
| 29. | 70619 | සවල් 1යි |
| 30. | 70615 | සවල් 1යි |
| 31. | 70614 | සවල් 1යි |
| 32. | 70142 | සවල් 1යි |
| 33. | 77940 | සවල් 1යි |
| 34. | 77939 | සවල් 1යි |
| 35. | 61675 | බැකෝ 1යි |

| අනු අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 36. | 77937 | සවල් 1යි |
| 37. | 77360 | සවල් 1යි |
| 38. | 63013 | බැකෝ 01 යි සවල් 1යි |
| 39. | 63095 | තට්ටු තරාදිය |
| 40. | 63096 | තට්ටු තරාදිය |
| 41. | 63097 | තට්ටු තරාදිය |
| 42. | 63404 | තට්ටු තරාදිය |
| 43. | 64371 | පොකට් බැලැන්ස් 01 යි |
| 44. | 65935 | තට්ටු තරාදිය |
| 45. | 31253 | සිලිකෝ වර්ගයේ කැසැට් යන්ත්‍රය |
| 46. | 37129 | පොකට් රේඩියෝ 03 යි, අත් ඔර්ලෝසු 05 යි, වොක්මන් රේඩියෝ 1 යි. |
| 47. | 33498 | පොකට් රේඩියෝ 01 යි |
| 48. | බී 31340 | අයිඩ් වර්ගයේ කැසට් යන්ත්‍රය |
| 49. | ඒආර් 72953 | වාහන කැසට් යන්ත්‍ර 01 යි |
| 50. | ඒආර්59919 | ඩෙක් යන්ත්‍ර 01 යි |
| 51. | ඒආර්79615 | වාහන සඳහා සවි කරන කැසට් යන්ත්‍ර 01 යි |
| 52. | ඒආර්76249 | ෂිප් වර්ගයේ කැසට් රේඩියෝව |
| 53. | ඒආර්58086 | සෝනි වර්ගයේ වීඩියෝ කැමරාව |
| 54. | ඒආර්77100 | ජංගම දුරකථන 03 යි. |
| 55. | ඒආර්79614 | ජංගම දුරකථනය |
| 56. | ඒආර්50606 | ජංගම දුරකථනය |
| 57. | ඒආර්53714 | ජංගම දුරකථනය |
| 58. | ඒආර්72954 | කුකුලා සලකුණ පහනක් |
| 59. | ඒආර්75181 | ප්ලාස්ටික් බට තොගයක් |
| 60. | ඒආර්79623 | ටකරන් තහඩු 17 යි |
| 61. | 90962 | රවුම් කියත් තලය |
| 62. | (92053) | කියත් තලයක් සවි කරන ලද වානේ වලින් සෑදූ ඉරුම් පට්ටල (මේස) 1 යි |
| 63. | 96336 | රවුම් කියත් තල 01 යි |
| 64. | 96335 | රවුම් කියත් තල 01 යි |
| 65. | 92834 | බීරල් මැසිමට මෝටරයක් සවිකරන ලද වඩු බංකුව හා කියත් තලය |
| 66. | අංක රහිත | ගැලුම් 45 බැරල් 05 යි. |
| 67 | අංක රහිත | ගැලුම් 45 බැරල් 05 යි. |
| 68. | අංක රහිත | ගැලුම් 45 බැරල් 05 යි. |
| 69. | අංක රහිත | ගැලුම් 45 බැරල් 05 යි. |
| 70. | අංක රහිත | ගැලුම් 45 බැරල් 05 යි. |
| 71. | අංක රහිත | ගැලුම් 45 බැරල් 05 යි. |
| 72. | අංක රහිත | ගැලුම් 45 බැරල් 05 යි. |
| 73. | අංක රහිත | ගැලුම් 45 බැරල් 05 යි. |
| 74 | අංක රහිත | ගැලුම් 45 බැරල් 05 යි. |
| 75. | අංක රහිත | ගැලුම් 05 බුලි 10 යි |
| 76. | අංක රහිත | ගැලුම් 05 බුලි 10 යි |
| 77. | අංක රහිත | ගැලුම් 05 බුලි 10 යි |
| 78. | අංක රහිත | ගැලුම් 05 බුලි 10 යි |
| 79. | අංක රහිත | ගැලුම් 05 බුලි 10 යි |
| 80. | අංක රහිත | කුඩා ගැලුම් 20 යි |
| 81. | අංක රහිත | කුඩා ගැලුම් 20 යි |
| 82. | අංක රහිත | කුඩා ගැලුම් 20 යි |
| 83. | අංක රහිත | කුඩා ගැලුම් 20 යි |
| 84. | අංක රහිත | කුඩා ගැලුම් 20 යි |
| 85. | අංක රහිත | කුඩා ගැලුම් 20 යි |
| 86. | අංක රහිත | කුඩා ගැලුම් 20 යි. |
| 87. | අංක රහිත | කුඩා ගැලුම් 20 යි |
| 88. | ඒආර් 59757 | පා පැදිය |
| 89. | ඒආර් 76720 | පා පැදිය |
| 90. | ඒආර් 73417 | පා පැදිය |
| 91. | ඒආර් 79347 | පා පැදිය |
| 92. | ඒආර් 58989 | පා පැදිය (හීරෝ වර්ගයේ) |
| 93. | ඒආර් 76719 | පා පැදිය |
| 94. | ඒආර් 73499 | පා පැදිය (ලුමාලා වර්ගයේ) |
| 95. | ඒආර් 74951 | මවුන්ටන් පා පැදිය |
| 96. | ඒආර් 66265 | භාගයේ පාපැදිය |
| 97. | ඒආර් 84936 | කොළ පැහැති පා පැදිය |
| 98.. | ඒආර් 78083 | පාපැදිය (හීරෝ වර්ගයේ) |
| 99. | ඒආර් 78083 | රෝසපාට මවුන්ටන් වර්ගයේ පා පැදිය |
| 100. | ඒආර් 73668 | පාපැදිය (ඩයිනමෝව සහිත) |
| 101. | ඒආර් 59050 | රතු හා ලා නිල් පැහැති පාපැදිය |
| 102.. | ඒආර් 62008 | මවුන්ටන් පාපැදිය |
| 103. | ඒආර් 62007 | භාගයේ පාපැදිය |
| 104. | ඒආර් 72162 | අංක 135-8062 දරන ප්‍රෙල් වර්ගයේ යතුරු පැදිය |
| 105. | ඒආර් 73400 | අංක 105-7162 දරන හොන්ඩා වැලි යතුරු පැදිය |
| 106. | ඒආර් 74835 | අංක 145-1441 දරන කහ පැහැති එම්බීඑස් වර්ගයේ යතුරු පැදිය |
| 107. | ඒආර් 71045 | අංක 149-9017 ඩී. එස් වර්ගයේ යතුරු පැදිය |
| 108. | ඒආර් 59762 | අංක 34-7033 දරන ඩෙලිකා වාහනය |
| 109. | ඒආර් 72613 | අංක 34 ශ්‍රී 2876 දරන ඩෙලිකා වාහනය |

02-180

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය අවලංගු කිරීම

පොල්කොටුවේ වලව්වේ පරාක්‍රම බණ්ඩාර බොකලවෙල වන මා විසින් වර්ෂ 2001 අප්‍රේල් 01 වැනි දින ලියා සහතික කරන ලද ඇටර්නි බලකරයේ ලද ප්‍රකාර මාගේ ඇටර්නි බලකරු ලෙසට පත් කරන ලද පොල්කොටුවේ වලව්වේ ලක්ෂ්මන් බණ්ඩාර බොකලවෙල යන අයගේ පත්වීම අද සිට එනම් වර්ෂ 2007 ජනවාරි මස 24 දින සිට වහාම අවලංගු කළ බව මින් දැනුම් දෙමි.

එම නිසා එකී ඇටර්නි බලකරයේ ප්‍රකාර ඇටර්නි බලකාර පොල්කොටුවේ වලව්වේ ලක්ෂ්මන් බණ්ඩාර බොකලවෙල යන අය හෝ ඔහුගේ නියෝජිතයෙකු පත්කරන ලද අයකු හෝ විසින් ඔහු වෙනුවෙන් හෝ මගේ ක්‍රියාවෙන් කරනු ලැබිය හැකි කිසිදු ක්‍රියාවක් වර්ෂ 2007 ජනවාරි 24 දා සිට නිත්‍යානුකූල නොවන බව ද මින් දැනුම් දෙමි.

පොල්කොටුවේ වලව්වේ පරාක්‍රම බණ්ඩාර බොකලවෙල.

අංක 72, රත්මල්කඩුව පාර,
සිංහපිටිය,
ගම්පොල.

02-297

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 15, මෝදර, සාන්ත ඇන්ඩෲස් පාර, අංක 96, දරන ස්ථානයේ පදිංචි විදානරාලලාගේ දොන් විරෝන් කෙනත් සුවාරිස් වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මංජුලා ශ්‍රීමතී ගනේෂන් විසින් සහතික කළ වර්ෂ 2005.07.18 දින හා අංක 4218 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කොළඹ 15, මෝදර, ශාන්ත අන්දරේ පාර, අංක 125 දරන ස්ථානයේ පදිංචි වර්ණකුලසූරිය පටබැඳිගේ ජූඩ් පීටර් පෙරේරා වෙත දෙන ලද ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරනු ලබන බව ද, මින්පසු එම ඇටෝර්නි බලපත්‍රය කිසිදු බලපැවැත්මක් නැති බවද, සියල්ලෝම මෙයින් දැන ගනිත්වා.

02-298

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ටොරන්ටෝ, ඔන්ටාරියෝ කැනඩාවේ පදිංචි මාඇල්ගේ කීර්ති වැනිලස් පෙරේරා සහ පැල්පොල ලියනගේ ශ්‍රීමා මානෙල් පෙරේරා යන අප විසින් දළුවාකොටුව, කොච්චිකඩේ පදිංචි මිහිඳුකුලසූරිය ජෝශප් විල්මට් රවීන්ද්‍ර ප්‍රනාන්දු වෙත ලබාදී ඇති 2004.02.23 දින දරන නිතිඥ තිලකා නාලිනී ද සොයිසා මහත්මිය විසින් සහතික කළ ඇටර්නි බලපත්‍රය 2006.12.08 වන දින සිට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත් ශ්‍රී ලංකාවාසී ජනතාවටත් මෙයින් දැනුම් දෙමු.
මෙයට,

මාඇලගේ කීර්ති වැනල්ස් පෙරේරා,
පැල්පොල ලියනගේ ශ්‍රීමා මානෙල් පෙරේරා.

02 – 342

---

### ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

පොල්ගස්ඕවිට, හල්පිට, දෙල්ගහවත්ත, අංක 8 හි පදිංචි විතානගේ අජිත් වසන්ත පෙරේරා වන මම මහජනතාවට මෙයින් දන්වා සිටින්නේ මා විසින් පිළියන්දල, කැස්බෑව, නිවුන්ගම, ගලපොඩවත්ත, අංක 55 හි පදිංචි ඉන්ද්‍රානි අබේසිංහ යන අය වෙත දී ඇති, කොළඹ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් එච්. කේ. එම්. ජයවර්ධන මහතා විසින් 2006.08.13 වන දින ලියා සහතික කළ අංක 1215 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවය.

මෙම දැන්වීම ප්‍රචාරය වන දින සිට ඉදිරියට එකී මාගේ ඇටර්නි බලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ගනුදෙනුවක හෝ වෙන යම් බැඳීමකට මා විසින් වගකීමක් නොදරන බව ද වැඩි දුරටත් මෙයින් දැනුම් දී සිටිමි.

විතානගේ අජිත් වසන්ත පෙරේරා

02 – 343

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීමයි

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද) අගනා දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

රංශ්‍යා ට්‍රේඩ් සෙන්ටර්

**9964 අංක දරන ඇපකරය යටතේ උකස් කරන ලද දේපල විස්තර**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, මුප්පනේ එගොඩවත්ත යනුවෙන් හඳුන්වනු ලබන මිනින්දෝරු ඩබ්ලිව්. විල්මට් සිල්වා මහතා විසින් සහතික කරන ලද 1980.06.28 දිනැති ප්ලෑන් අංක 212 දරන බෙදා වෙන් කල ලොට් අංක 15,16 හා 17 සහ බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර මහතා විසින් සහතික කරන ලද, 1995.10.07 දිනැති ප්ලෑන් අංක 289 දරන ලොට් අංක 01,

*ඉඩම් ප්‍රමාණයෙන්*:- ලොට් 15-අක්කර 0 රූඩ් 0පර්චස 2.19, ලොට් 16 - අක්කර 0 රූඩ් 0 පර්චස් 00.5, ලොට්.17 - අක්කර 0 පර්චස් 0.85.

ප්ලෑන් අංක 289 දරන 1995 ඔක්තෝබර් 07 වන දින එල්. කේ. ගුණසේකර මහතා විසින් සහතික කළ ලොට් 01-අක්කර 0 රූඩ් 0 පර්චස් 04 එහි පිහිටි ගොඩනැගිලි හා සෑම සියළු දේද සමග

2007 පෙබරවාරි මස 27 වන අඟහරුවාදා පෙ.ව. 11.00ට එම ස්ථානයේම සහ එදිනම දහවල් 12.00ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*10193 අංක දරන ඇපකරය යටතේ උකස් කරන ලද දේපල විස්තර*:-

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල මුප්පානගම "පොල්ලන්දේකනත්ත" යනුවෙන් හඳුන්වනු ලබන මිනින්දෝරු එල්. කේ. ගුණසේකර මහතා විසින් සහතික කරන ලද ප්ලෑන් අංක 4327 දරන 2001 මාර්තු 01 වන දින ඇපකරය යටතේ ගෙවීම් සිදුවී නොමැත. ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල අනුව ලොට් අංක 01 යනුවෙන් නිරූපිත ඉඩම් කොටස.

ඉඩම ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 9.2 එහි පිහිටි ගොඩනැගිලි හා සෑම සියළු දේද සමග ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කළ දේපල "රන්ශ්‍යා ට්‍රේඩ් සෙන්ටර්" අයිතිකරු වන මොණරාගල පදිංචි ලොකුහේව ගමගේ රංජිත් මහතා විසින් ඩී.එෆ්.සී.සී. බැංකුවට උකස් කරන ලද ණය අංක 9964 සහ 10193 දරන 2003 දෙසැම්බර් 19 සහ 2004 අප්‍රේල් 28 වන දින බදුල්ල සුප්‍රසිද්ධ නොතාරිස් අයි.එම්.ජී. ආනන්ද මහතා විසින් සහතික කළ

*ගෙවීමේ ක්‍රමය*:- මිල තීන්දු වනවාත් සමගම, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක් ;
2. පළාත් අධිකාරයට ගෙවියයුතු 1%ක් වන විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක් පමණයි) ;
4. රු.35,000.00 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක් ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500 යි ;
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000 යි.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් අධිකාරියක් මගින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු

අයකිරීම් වෙතොත් ඒවාද, සමග අදාල පරිදි වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩී.එෆ්.සී.සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව වෙතින් විමසන්න.

දුරකථන අංක : 011-2440366

ශොක්මන් සහ සමරවික්‍රම
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී,
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ

*ප්‍රධාන කාර්යාලය* :
24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස්අංකය : 081-2224371

*නගර කාර්යාලය* :
290, හැව්ලොක් පාර, කොළඹ 05.
දුරකථන අංකය : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් : 011 2588176
ඊමේල් : samera@sri.lanka.net

02-283

---

## රුහුණ සංවර්ධන බැංකුව - පිටබැද්දර ශාඛාව

1990 අංක 04 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපල 2007.02.27 දින ප. ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර* :- දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියඹලාගොඩ ගමේ පිහිටි, අගපි 12 හි අංක 277 සහ 280 දරණ කැබලි වලින් සමන්විත මහඅලදෙනියහේන. නාවලහේන, කලුගලහේන නම්වූ ඉඩම මැදින් වැටී ඇති පාර සහ පාර රක්ෂිත බිම හැර අක්කර විසිදෙකයි, රූඩ් දෙකයි, පර්චස් තිස්හතක් (22 අක්. 02 රූඩ්. 37 පර්.) ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියළු ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදියද වේ.

*වැඩි විස්තර සඳහා* :- 2006.09.29 දින රජයේ *ගැසට් පත්‍රයද*, 2006.11.27 දින දිනමිණ, තිකකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වලද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම* :- පිටබැද්දර නගරයේ සිට සියඹලාගොඩ පාරේ කි. මී. 1.4 ක් පමණ ගිය විට හමුවන කළුගහහේන පාරේ කි. මී. 01 ක් පමණ ගිය විට හමුවන හන්දියෙන් දකුණට වැටී ඇති පාරේ කි. මී. 01 ක් පමණ ගිය විට හමුවන හන්දියෙන් දකුණට ඇති පාරේ මීටර් 600 ක් පමණ ගිය විට මෙම දේපල පාරේ දෙපසින්ම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* :- වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් 10% ක් ද ;
2. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1% ක් ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් 2 1/2% ක් ද ;
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500/- ක් ද ;
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදලද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382 ඒ, දරණ ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරී මහතාට ගෙවිය යුතු ය.

ඉහත සඳහන් පරිදි දින 30 ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක 041-2231532, 2226208, 2226209

පී. පී. ආනන්ද,
බලයලත් වෙන්දේසිකරු,
උසාවිකොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර
දුරකථන අංකය : 041-2228731

02-183

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (ගම්පහ ශාඛාව)

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම කෝරළේ, යටිගහ පත්තුවේ මින් පෙර කල්එළිය නමින් හැඳින්වූ මල්ලෑහැප යන ගමෙහි පිහිටි බණ්ඩාරවත්ත නොහොත් කහටගහවත්ත යන නමින් හඳුන්වනු ලබන බලයලත් මානක ඩබ්ලිව්. පී. එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද 2001 ජනවාරි මස 23 වන දිනැති අංක 1212 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස ලකුණු කර ඇති රූඩ් එකක් ( අ. 0, රූ. 1, ප. 0) විශාල ඉඩම කොටස

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. ඩබ්ලිව්. ජයසුන්දර විසින් සහතික කරන ලද්දා වූ ද, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (පෙර ජාතික සංවර්ධන බැංකුව) නමට ලියන ලද්දාවූ ද, 2001 ක් වූ සැප්තැම්බර් මස 21 වන දින අංක 194 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, සුමුදුසිරි මැකැනිකල් වුඩ් වර්ක්ස් යන නාමය විලාශය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන මුණසිංහ දේවගේ ශාන්ත කුමාර මුණසිංහ සහ මුණසිංහ දේවගේ සරත්චන්ද්‍රපිස් ණයට ගන්නන් හැටියට පැහැර ඇති බැවින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් (පෙර ජාතික සංවර්ධන බැංකුව) විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් කල දේපළ 2007 මාර්තු මස 01 වන දින පෙරවරු 11.00 දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2006 දෙසැම්බර් මස 29 වන දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය ද*, 2006 දෙසැම්බර් මස 15 වන දින දිවයින ද අයිලන්ඩ් යන තිනකරන් යන පුවත් පත් ද බලන්න.

ගෙවීමේ ක්‍රමය .– වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය.

(1) ගැණුම් මිලෙන් 10%ක් ද,
(2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද,
(3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද,
(4) රු. 55,000 නොවැඩි වෙන්දේසි වියදම් වලින් 50%ක් ද,
(5) ලිපිකරු හා ගෝෂක ගාස්තු, වශයෙන් රු. 500ක් ද,
(6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2,000 ක් වේ. ගැණුම් මිලේ ඉතිරි මුදල වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්හි තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩිදුර විස්තර සඳහා විමසන්න කොළඹ 02, නවම් මාවතේ අංක 40, පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් හි උප සභාපතිනි නීතිගෙන් විමසන්න. දුරකථන අංක 2437701 – 10, හෝ 2448448

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා වරලත් වෙන්දේසිකරු.

134,
බැද්දගාන පාර,
කෝට්ටේ,
දුරකථන අංකය : 2873656,
ෆැක්ස් අංකය : 2871184, ජංගම 0777 - 672082

02 – 344

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - නුගේගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර,

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරිපත්තුවේ සියනෑ කෝරළේ මහර ප්‍රාදේශීය සභා සීමාවේ අංක 01 දරන උප කාර්යාල සීමාවේ මහර කැන්දලියද්ද පාළුව පිහිටි දේල්ගහවත්ත, අඹගහදෙනිය සහ අඹගහවත්ත හෙවත් තුන්හවුල් කුරුඳුගහවත්ත ඉඩමේ කොටසක පිහිටි ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේත් සමඟ වෙන් කරන ලද ලොට් ‘එෆ්’ දරන පර්චස් දහයක (අ. 0, රූ. 0, ප. 10) විශාල ඉඩම වේ.

ෂාමේන් ජෝසපින් ද වෙසෝර් ණයකරු සහ උකස්කරු හැටියට ද සහ කරුණානායකගේ ජෝර්ජ් ශාන්ත ද සිල්වා ණයකරු හැටියට ඔවුන් විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ,

වර්ෂ 2007 ක් වූ මාර්තු මස 06 වන දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙනදේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.09.22 වන දින රජයේ *ගැසට් පත්‍රය* ද 2006.09.25 දිනැති ලංකාදීප, අයිලන්ඩ් සහ තිනකරන් පත්‍රය ද බලන්න, විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2007.02.09 වන දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, ලංකාදීප සහ අයිලන්ඩ් පත්‍රය ද බලන්න.

ඉඩමට පිවිසීම.– කඩවත ප්‍රධාන හන්දියේ සිට ගනේමුල්ල පාර දිගේ සැතපුම් 3ක් පමණ ගොස් වැලිපිල්ලෑව හන්දියේ දී වමට හැරී, මහර බන්ධනාගාරය වෙත දිවෙන තාර දැමූ ප්‍රසිද්ධ පාර දිගේ යාර 75 ක් පමණ ගොස් දකුණට හැරී, මීටර් 6.0 පලල පෞද්ගලික බොරළු පාරේ ( ලොට්ස් ) එක්ස් සහ 9) තවත් යාර 100 ක් පමණ ගොස් දකුණට හැරී, මීටර් 3.0 ක් පළල වෙන් කරන ලද (ලොට් ඊ) පෞද්ගලික පාර දිගේ යාර 20ක් ගියවිට එහි අවසානයේදී මෙම ඉඩමට ළඟාවිය හැක. ඉඩමටම මෝටර් රථ මගින් යා හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සහා අයබදු සඳහා සියයට එකයි (1%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි ( 2.5%) ;
4. නොතාරිස් ගාස්තුව විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ;
5. ලිපිකරු සහ ඝෝෂක වේතනය රු. 500 ;
6. සියලුම ප්‍රචාරක වියදම් ;
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව ( 90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් එෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ හෝ නුගේගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
නො. 100, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.
දුරකථන අංක : 2852320
2810942 - 3
ෆැක්ස් අංකය : 2810944

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්, කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, රාජ්‍ය සහ වාණිජ බැංකු.
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංක : 2445393.

02 – 345

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ දිසා අධිකරණයේ දී ය

සෙලාන් මර්චන්ට් බැන්ක් ලිමිටඩ්,
අංක 283, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

දැනට 'ලෑන්ඩ් මාර්ක් බිල්ඩිං',
අංක 385, ගාලු පාර,
කොළඹ 03.

................................................ *පැමිණිලිකරු*

නඩු අංක : 16885/එම්.බී.

– *එදිරිව* –

01. අගම්පොඩි ගුණපාල ද සිල්වා

02. දයාවතී දඩල්ලගේ
දෙදෙනාම : දික්වැල්ල, වත්තේගම, විදානෙගෙවත්තේ, 'ඒ. පී. ජී. ද සිල්වා සහ සමාගම' යන නාමය, විලාශය සහ ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාපාර ගෙනයති.

03. දඩල්ලගේ සනී විජේසේන, බත්ගම, දික්වැල්ල.

.................................................... *විත්තිකරුවන්*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ නියෝගය අනුව ඉහත කී දෙවන සහ තුන්වන විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට එක්ව සහ/හෝ වෙන වෙනම රු. 5,00,000 ක මුදලක් සහ ඒ මත 1997 අප්‍රේල් මස 08 වෙනි දින සිට තීන්දු ප්‍රකාශ දින තෙක් වර්ෂයකට 30%ක ගණනේ වැඩිදුරටත් වන පොලිය හා ව්‍යාපාරික පිරිවැටුම් බද්ද, ආරක්ෂක බදු සහ නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇත. වර්ෂ 2000ක් වූ මැයි මස 04 වැනි දින දරන කොළඹ දිසා අධිකරණ නඩු තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට දෙවන සහ තෙවන විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ, එම දේපළ පිහිටි ස්ථානයේ දී වර්ෂ 2007 ක් වූ මාර්තු මස 02 දින ප. ව. 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නියෝග කරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ මාතර දිස්ත්‍රික් සංවර්ධන සභාවේ දික්වැල්ල උප කාර්යාලය සීමාව තුළ බතීගම පිහිටි මාතර පාරේ වරිපනම් අංක 202/6 දරන කොහුවල වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් සම්පාදිත 1983 මාර්තු 02 වන දින අංක 243 දරන සැලැස්මයේ ලොට් 2 දරන එකී අංක 243 දරන සැලැස්මය ප්‍රකාර උතුරට : ලොට් අංක 1 සහ 3 ද, නැගෙනහිරට : මහගෙදර වත්ත ද දකුණට : අනිත් කොහුවල වත්ත සහ බස්නාහිරට : ලොට් අංක 1 ද මායිම් වූ පර්චස් විසිදෙකයි දශම පහක් (අ. 0 රූ. 0 ප. 22.5) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන්කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල හා ඒ තුළ ඇති සියළු දේත් වේ. මාතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ බී 533/30 හා ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් කැබැල්ල උඩින්, එතුලින් සහ ඔස්සේ මාර්ග අයිතිය සමඟ :

ඉහත කී බතීගම පිහිටි කොහුවල වත්ත නමැති ඉඩමේ ඉහත කී අංක 243 දරන සැලැස්මයේ ලොට් 3 දරන ( පාරක් සඳහා වෙන්කර ඇති ) උතුරට : ලොට් අංක 1 ද, නැගෙනහිරට : ලොට් අංක 1 ද, දකුණට : ලොට් අංක 2 සහ බස්නාහිරට : පාර ද මායිම් වූ එකී අංක 243 දරන සැලැස්මය ප්‍රකාර පර්චස් දශම හතරක් (අ. 0 රූ. 0 ප. 0.4) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද නිශ්චිත ඉඩම් කැබැල්ල වේ. මාතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ 533/31 හි ලියාපදිංචි කර ඇත.

*ඉඩමට පිවිසීම.–* මාතර, දික්වැල්ල නගරයේ සිට මාතර දෙසට කි. මී. 1/2 ක් පමණ ඉදිරියට එනවිට දික්වැල්ල විලේජ් හෝටලය හමුවේ. එම හෝටලය පසුකර මීටර් 50 ක් ඉදිරියට ගියවිට දකුණු දෙසින් කටුකුරුන්ද වත්ත පාර හමුවේ. මෙම කටුකුරුන්ද පාරේ හැරී මීටර් 50ක් පමණ ඉදිරියට ගියවිට දකුණු දෙසින් මෙම දේපළවලට පිවිසිය හැක. මෙහි ලිපිනය නම් අංක 202/22, බතීගම, දික්වැල්ල වේ.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ :

01. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%);
02. නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තු රු. 4,000 ;
03. සියලුම ප්‍රචාරක වියදම් ද ;
04. වෙන්දේසිකරුගේ ගාස්තු 2.5% ;
05. රජයේ ගාස්තු ;
06. ලිපිකරු සහ සෝෂක ගාස්තු රු. 2,500 ;
07. ඉතිරි 75% ක මුදල දින 30ක් ඇතුළත දී කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුයි.

ඔප්පු පරීක්ෂා කිරීම සඳහා සහ වැඩි විස්තර සඳහා පහත අයගෙන් විමසන්න.

ලිවේරා ඇසෝසියේට්,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්,
අංක 33 – 1/2, ෂර්බරී ගාඩ්නස්,
කොළඹ 04.
දුරකථන අංක : 2584622
2592872 – 3

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්, කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය, රාජ්‍ය බැංකු සහ වාණිජ බැංකු
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංක : 2445393.

02–346

## සීමාසහිත සෙලාන් බැංකුව - මාලඹේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 04 දරන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල පාදුක්ක හි ලියාපදිංචි අංක ඩබ්ලිව් ඊ 190 දරන ගලගෙදර මෙටල් ක්‍රෂර්ස් යන නාමය, විලාශය සහ අභිමානය යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන තලංගම උතුරෙහි කංකානිලාගේ ලයනල් කරුණාරත්න පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

**පළමු විකිණීම**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කොරතොට ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. ඊ. එන්. ජයවර්ධන විසින් සාදන ලද 1994 මාර්තු 10 දිනැති අංක 711 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දැන් ලේක් ටෙරස් නමින් හඳුන්වනු ලබන වනපොතුමූකලාන *හෙවත්* වයි එස්ටේට් නමැති ඉඩමේ කැබලි අංක 24 ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කැබැල්ල පෙර කී අංක 711 දරන සැලැස්ම අනුව පර්චස් විසි පහයි දශම හතයි අටක් (අ. 0 රූ. 0 පර්. 25.78) *නොහොත්* හෙකටයාර් 0.0652 ක් විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව පී 974/180 යටතේ ලියාපදිංචි කර ඇත. ඉහත සඳහන් දේපල 2007 මාර්තු මස 06 වන දින පෙ. ව. 10.00 ට ඉහත සඳහන් දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* .– අතුරුගිරියේ සිට ශාන්තාලෝකගම පාරේ (මිලේනියම් සිටි නිවාස සංකීර්ණය පසුකර) සැතපුම් 1.5 ක් ගොස් දකුණට ඇති ලේක් ටෙරස් පාරේ පළමු අදියර යනුවෙන් සඳහන් ස්ථානයේ පිහිටා ඇත. (යාර 150 ක් පමණ දුරින්).

**දෙවන විකිණීම**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ මැද පත්තුවේ සීතාවක ප්‍රාදේශීය සභා සීමාව තුල ගලගෙදර පිහිටි 1975.10.04 දිනැති අංක 5861 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගල්ගොඩේ වත්ත නමැති ඉඩමේ කැබලි අංක 2 ඩී ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි නමයහමාරක් (අක්. 0 රූ. 01 පර්. 29.5) විශාල ගොඩනැගිලි, ගස්, යන්ත්‍රසූත්‍ර සහ එහි පිහිටි සියළු දේ සමග ඉඩම. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 8/39 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2007 මාර්තු මස 06 වන දින පෙ.ව. 11.30 ට ඉහත දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* .- ගලගෙදර හංදියේ සිට පාදුක්ක පාරේ යාර 50ක් ගිය විට දේපළට පිවිසිය හැක. යෝජනා සම්මුති දැන්වීම 2005.05.06 වන දින රජයේ *ගැසට් පත්‍රයේද* 2005.04.19 වන දින ඩේලි නිව්ස්, දිණමින සහ තිනකරන් යන පුවත්පත්වල ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය : 1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්) 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්) 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 ලිපිකරු සහ සෝෂක වේතනය රු.500 6. සියළුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2456285, 2456263, 2456284.

ටී. ඇන්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක 011-2696155, 011-2572940

තුසිත කරුණාරත්න,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු.

02-281

---

## සීමාසහිත ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීම

**කේ. එම්. එස්. ට්‍රේඩර්ස්**

ඩී. එෆ්. සී. සී. බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තැව මහතා විසින් ලියා සහතික කරන ලද 2003.08.12 දාතම හා අංක 1926 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය යටතේ හා සීමාසහිත ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුවේ උකස් බැඳුම්කර අංක 12228 යටතේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ, දඹදෙනි උඩුකහ කෝරළ දකුණේ අලව්ව හි පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. ඒ. අමරතුංග මහතා විසින් මැන සාදන ලද 2002.11.21 ලොට් 5 වශයෙන් සළකුණු කර ඇති 'ඇත්දෙමටගහමුලහේන' දැන් වත්ත යනුවෙන් හඳුන්වනු ලබන, බෙදා වෙන්කර හා මායිම් නිර්ණය කර ඇති සම්පූර්ණ ඉඩම් කොටස.

ඉඩම ප්‍රමාණයෙන් අක්කර 0 රූඩ් 0 පර්. 2.4. වරිපනම් අංක 66 දරන කඩ කාමරය හා එහි පිහිටි සැම සියළු දේද සමඟ ඩී. එෆ්. සී. සී. වර්ධන බැන්ක් ලිමිටඩ් හා ඩී. එෆ්. සී. සී. බැංකුව මගින් අප වෙත පවරන ලද බලතල ප්‍රකාර, එකී දේපළ අප විසින් 2007 මාර්තු මස 01 වන බ්‍රහස්පතින්දා පෙ. ව.11.00 ට ආරම්භව පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තවද එම දිනයේදීම පෙ. ව. 11.15 ට ආරම්භව, පිහිටි ස්ථානයේදී පහත සඳහන් ප්‍රසිද්ධ වෙන්දේසියද පැවැත්වේ :

සීමාසහිත ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුව නමට, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල මහතා විසින් ලියා සහතික කරන ලද 2004.12.17 දාතම හා අංක 12228 දරන උකස් බැඳුම්කරය යටතේ, වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ, උඩුගහ කෝරළ දකුණේ අලව්ව හි පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඒ. අමරතුංග මහතා විසින් මැන සාදන ලද1999.07.13 දාතම හා අංක 683 දරන පිඹුරේ ලොට් 4බී වශයෙන් සලකුණු කර ඇති (එකී මිනින්දෝරු කේ. ඒ. අමරතුංග විසින් සාදන ලද 2003.09.12 දාතම දරන උපබෙදුම) 'ඇත්දෙමටගහමුලහේන' යනුවෙන් හඳුන්වනු ලබන සම්පූර්ණ ඉඩම් කොටස්.

ඉඩම ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 0.6. එහි පිහිටි හා එයට සම්බන්ධව පවතින ගොඩනැගිලි, වැව්ලි හා සෑම සියළු දේද් සමග ඩී. එෆ්. සී. සී. වර්ධන බැන්ක් ලිමටඩ් හා ඩී. එෆ්. සී. සී. බැංකුවට මෙම දේපල උකස් තබන ලද අලව්වේ 'කේ. එම්. එස්. ට්‍රේඩර්ස්' යන ව්‍යවහාර ව්‍යාපාරික නාමය හා අභිධානය යටතේ එහි තනි අයිතිකරු වශයෙන් ව්‍යාපාර පවත්වාගෙන යන කපුගම මානික්කගේ සෝමරත්න යන අය විසින් එකී උකස් බැඳුම්කර අංක 12228 සහ 1926 යටතේ ගෙවිය යුතු ගෙවීම් පැහැරහැර ඇති හෙයිනි,

*ගෙවීමේ ක්‍රමය*- මිල තීන්දු වනවාත් සමග, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක් ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක් පමණයි.) ;
4. රු. 31,500 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% ක් ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500 ;
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් අධිකාරියක් මගින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග අදාල පරිදි වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුලත ගෙවිය යුතුය.

*වැඩිදුර විස්තර සඳහා*.- කරුණාකර ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව වෙතින් විමසන්න. දුරකථන අංක : 011 – 2440366

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී,
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

*ප්‍රධාන කාර්යාලය* :

24, ටොරින්ටන් පාර, මහනුවර.
දුරකථන : 081-2227593
දුරකථන/ෆැක්ස් : 081-2224371

*නගර කාර්යාලය* :

290, හැව්ලොක් පාර, කොළඹ 05.
දුරකථන : 011-2502680, 2585408.
දුරකථන/ෆැක්ස් : 011-2588176.
ඊ-මේල් : samera@sri.lanka.net

02-282

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - බොරලැස්ගමුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය ආපසු අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා ඉඩම් වෙන්දේසියක්

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඔලුව විසින් සහතික කරන ලද්දාවූ ද සී/ ස. හැටන් නැෂනල් බැංකුව නමට ලියන ලද්දාවූද, 2002.03.13 සහ 2003.09.09 දින සහ පිළිවෙලින් අංක 216 සහ 582 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම - මලින් චානක දූල්ලෑව - ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

සී. ස. හැටන් නැෂනල් බැංකුව මගින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල පිහිටි ස්ථානයේ දී වර්ෂ 2007 ක්වූ මාර්තු මස 01 වැනි දින පෙ. ව. 11.00 සිට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟපළාත, යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මොළෙදණ්ඩ පිහිටි 'එළුහාගොඩ' *හෙවත්* 'එලුහාගොඩහේන' 'තොටපොලදෙණිය' 'හිරිතලගොල්ල' සහ 'කුරුම්බේහේන' නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානත එන්. බී. ඩී. වැත්තෑව විසින් මැන සෑදූ අංක 790 සහ 1988.07.05 දින පිඹුරට ඔහු විසින්ම 2001.09.13 දින නැවත පිටසන්කළ පිඹුරේ ලොට් 2 බී ලෙස සළකුණු කළ ඉඩම සහ එහි පිහිටි සියලුදේත් සමඟ වේ. (විශාලත්වය පර්චස් 25)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.07.28 දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2006.08.02 දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* :- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදලින් වෙන්දේසිකරුට ගෙවීම් කළ යුතුය.

01. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ක් ද ;
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද ;
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලෙන් සියයට දෙකහමාරක් (2 1/2%) ;
04. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු. 500) ක් ද ;
05. සියළුම ප්‍රචාරක වියදම් ද ;
06. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රු. දෙදහක් (රු. 2000) ගැණුම් මිළෙන් ඉතිරි 90% ක්වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සී./ස. හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු සහ අදාළ ලියවිළි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සී. ස. හැටන් නැෂනල් බැංකුව, බොරලැස්ගමුව ශාඛාව (දු. ක. අංක 2516533/ 2516534) හෝ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479, ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමනාකරු (අයකිරීම්) දු. අංක. 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

02-274

## සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකිණීමයි

ජේ. වී. සී. ද කෲස් - ගිණුම් අංකය 1001 5074 6994.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.08.26 වන දින යෝජනා කොට සම්මත කර ගනු ලැබ 2006.12.08 දින රජයේ *ගැසට් පත්‍රයේ* ද 2006.11.28 දින දිවයින, අයිලන්ඩ් හා තිනකුරල් යන දිනපතා පුවත්පත් වලද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි ලක්ෂ අටදහස් දෙසීය හැට අටකුත් ශත අසූහතරක ( රු. 2,008,268.84 ) මුදල සමග තවත් රුපියල් හත් ලක්ෂ දහ දහස් පනස් තුනකුත් ශත හැට එකක (රු. 710,053.61) මුදල සඳහා වසරකට සියයට දහඅටයි දශම හතයි පහ(18.75%) බැගින් සහ තවත් රුපියල් හය ලක්ෂ විසි හත් දහස් හයසිය විසිහතරකුත් ශත නවයක (රු. 627,624.09) මුදල සඳහා වසරකට සියයට දහඅට (18%) බැගින් 2005 ඔක්තෝබර් මස 30 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩන්ස්ටන් කෙලාට් විසින් 2007.02.26 දින පෙ. ව. 10.30ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ, පල්ලේපත්තුවේ, දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව ඇතුළත, නාගරික කොට්ඨාශ අංක 15 කවුඩාන නැගෙනහිර තුළ අත්තිඩියේ පිහිටි හිල් වීදියේ, වරිපනම් අංක 248/87 දරන, හීනිරිවල්ල, අත්තිඩිය වෙල්යාය *නොහොත්*, කොලවින්නම්බිට නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු සී. ඊ. එන්. ජයවර්ධන විසින් සාදන ලද 1994 මැයි 10 දාතම හා අංක 715 දරන පිඹුරේ ලොට් 18 වශයෙන් ලකුණු කොට දක්වා ඇති ගල්කිස්ස ඉඩම් කාර්යාලයේ එම් 2169/292 හි ලියාපදිංචි කළ එකී අංක 715 දරන පිඹුර ප්‍රකාර උතුරට ලොට් ඒ(මීටර් 12 ක් පළල පාරකට වෙන් කළ කොටස) නැගෙනහිරට ලොට් 1 (මීටර් 9ක් පළල පාරකට වෙන් කළ කොටස) ද, දකුණට ලොට් 35 ද සහ බටහිරට ලොට් 17 ද මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම බිංදුවයි දෙකක් (අක්. 0, රූඩ් 0, පර්. 13.02) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළය සම්පූර්ණ බිම් කොටසය.

ඉහත කී අංක 715 පිඹුරේ නිරූපිත ලොට් A, B, C, D, E, F, G, H, I, K, L හා M වශයෙන් ලකුණු කොට ඇති මාර්ගය භාවිතා කිරීමේ අයිතිය සහ SLLRDC/47 දරන පිඹුරේ නිරූපිත අඩි 30 ඩී පළල මාර්ගයද භාවිත කිරීමේ අයිතිය ද හා සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගමේ ලේකම්.

02-347/7

## මහජන බැංකුව - බොරැල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 ඩී දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ මාලඹේ පිහිටියාවූද, අලුබෝගහවත්ත යයි කියනු ලබන ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්. 13.20 ක් විශාල ඉඩම,

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මා විසින් 2007 පෙබරවාරි මස 24 වන දින පෙ. ව. 11.00ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා* .— 2003.09.05 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2003.08.25 වන දින දිනමිණ, ඩේලිනිවුස්, සහ තිනකරන් යන පුවත්පත් වල පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසෙන මාර්ගය* .— මාලඹේ සිට අතුරුගිරිය පාරේ කි. මී. 1/2 ක් පමණ ගිය විට පාරේ වම් පස සුසිලාරාම පාර හමුවේ. එම පාරේ කි. මී. 1/4 ක් පමණ ගොස් පාරේ දකුණු පසට ඇති ගුරු පාරේ මීටර් 200 ක් පමණ ගිය විට පාරේ වම් පස අංක 520/18 දරන අදාල දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .— වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2-1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත කොළඹ 01, අංක 11, ආදිපාද වීදියේ පිහිටි මහජන බැංකු කලාප කාර්යාලයේ (බටහිර කලාපය - 01) සහකාර සාමාන්‍යාධිකාරිට ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථනය : 2327848, 2393678, 4-717008.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
මුළු දිවයිනටම සාම විනිසුරු.

අංක 11/55, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථනය : 2419126, ෆැක්ස් - 074 -719526.

02-348

## මහජන බැංකුව - කැළණිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කැළණිය, ඊරියවැටිය හි පදිංචියට හෝ ව්‍යාපාරික කටයුතු සඳහා සුදුසු පරිසරයක පිහිටි වානිජ ගොඩනැගිල්ලක් සහිත රූඩ් එකයි පර්චස් එකයි දශම හතයි පහ (රූ. 1, පර්. 1.75) ක ඉඩම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.03.14 වන දින පෙ. ව. 10.30ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ* 1998.03.27 වන දිනද, ඩේලිනිවුස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 1998.03.09 වන දිනද, එල කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසෙන මාර්ගය* .—කොළඹ නුවර පාරේ කොළඹ සිට පැමිණෙන විට කිරිබත්ගොඩ නගරයෙන් වමට ඇති ඊරියවැටිය පාරේ මී. 400 ක් පමණ ගියපසු පාරේ වම්පස මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .— වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත සහකාර සාමාන්‍යාධිකාරී, මහජන බැංකුවට බටහිර කලාප 111 කාර්යාලය, අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ වෙත ගෙවිය යුතුය.

දුරකථනය : 033-2222325, 033-2225008, 033-2226741, 033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ටී. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
මුළු දිවයිනටම සාම විනිසුරු.

අංක 11/55, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථනය : 2419126.

02-349

## මහජන බැංකුව - මහර ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කඩවත, දලුපිටිය, අංක 63 හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි පර්චස් 19.84 ක් සහ පර්චස් 9.92 ක (අ. 0, රූ. 0, පර්. 19.84 සහ අ. 0, රූ.ඩ් 0, පර්. 9.92) ඉඩම් කැබලි දෙක.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.02.23 වනදින පෙ. ව. 10.30ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ* 2000.12.01 වන දිනද, ඩේලිනිවුස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත් වල 2005.07.25 වන දිනද, පල කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසෙන මාර්ගය* .— මහර හන්දියෙන් දලුපිටිය පාරේ මී. 700 ක් පමණ ගියවිට වමට ඇති සිරිනිකේතාරාම පාරේ මී. 400 ක් පමණ ඉදිරියට ගියවිට පාරේ වම් පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .— වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2-1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර අංක 131, මහජන බැංකුව, බටහිර කලාප 111 කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරී වෙත ගෙවිය යුතුය.

දුරකථනය : 033-2222325, 033-2225008, 033-2226741, 033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ටී. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ තක්සේරුකරු,
මුළු දිවයිනටම සාම විනිසුරු.

අංක 11/55, කුඩාබුත්ගමුව,
අංගොඩ.
දුරකථනය : 2419126.

02-350

## ඩී.එෆ්. සී. සී. බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 4 වන වගන්තිය යටතේ විකිණීමයි

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, තණමල්විල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ බුත්තල කෝරළේ කතරගම ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ කතරගම, දෙටගමුව පිහිටි බලය ලත් මිනින්දෝරු ජී. ඩී. යූ. කරුණාරත්න විසින් සාදන ලද 1994.09.17 දින අංක 1143 දරන පිඹුරේ නිරූපිත එෆ්.වී.පී. 25 හි ලොට් 163 දරන දෙටගමුවයාය නැමැති ඉඩමේ ලොට් 1 වශයෙන් ලකුණු කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ භූමිය එහි පිහිටි පස, ගහකොළ වගාවන් හා සෑම සියලු දේ සමග
ප්‍රමාණයෙන් අක්. 1 ක ඉඩම)

ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය පරිදි ඉහත කී දේපළ මා විසින් 2007.02.28 වැනිදා බදාදා ප. ව. 2.30ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(මෙම දේපළ ඩී.එෆ්.සී.සී. බැංකුවට උකස් තැබූ, කොළඹ 5, ජයසිංහ ටුවර්ස් ඇන්ඩ් එන්ටර්ප්‍රයිසස් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාපාරික කටයුතු කරගෙන යන ජගත් චන්ද්‍රකීර්ති ජයසිංහ සහ ගුණමුනි කිෂානි රේණුකා ද සිල්වා සහ කොළඹ 05, අයිරාංගනී මෙන්ඩිස් ගුණසේකර යන අය ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එල්. වයි. ද සිල්වා විසින් ලියා සහතික කල මාර්තු 1 වැනි දින අංක 2510 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයිනි)

*ගෙවීමේ ක්‍රමය .—*

1. මිල තීන්දු වූ වහාම ගැණුම් මිලෙන් 10% ක්,
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% (ඒ.අ.බ.) වැට් බද්ද සමග ශ්‍රී ලංකා රජය හා වෙනත් අධිකාරියක් විසින් පනවන ලද කිසියම් ප්‍රකාශන බදු, තීරුබදු ගෙවීම්, නඩත්තු කිරීම් වෙතොත් ඒ සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය විකුණුම් බද්ද 1% (සියයට එකයි),
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරයි),
5. රු. 33,175 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමෙන් 50%,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 2,500,
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,500, කොළඹ 3, ගාලු පාරේ අංක 73/5හි ඩී.එෆ්.සී.සී. බැංකුවේදී අදාල ඔප්පු හා ලිපි ලේඛන පරීක්ෂාකර බැලිය හැකිය. දුරකථන - 440366.

ඩන්ස්ටන් කෙලාට්.
උසාවි කොමසාරිස්, බ්‍රෝකර්, විශේෂඥ
වෙන්දේසිකරු, තක්සේරුකරු, සහ දේපළ නියෝජිත.

අංක 42,
දුටුගැමුණු වීදිය,
පාමංකඩ,
දෙහිවල.

දුරකථන : 2814742, ෆැක්ස් - 2814743, 2814744.

ක්ෂණික ඇමතුම් : 0772250422.

02-334

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය 2200000110.

ණයකරුගේ සම්පූර්ණ නම - තිස්සවලංගු මුදියන්සේලාගේ තිස්ස බණ්ඩාර
හෙවත් තිස්සවලංගු මුදියන්සේලාගේ
උක්කු බණ්ඩාර

(මෙහි මින් මතු බැංකුව යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2002.11.01 වන දින අංක 1261, දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2002.11.01 වන දින දිනමිණ, ද අයිලන්ඩ්, තිනක්කුරල් පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපල බදුල්ල, කලුගල්පිටිය, අංක 48/1, යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්ලිව්. ජයතිලක මයා විසින් 2007.02.27, වන දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරනලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්හතර දහස් හත්සිය පනස් හතයි ශත පනස් තුනයි (රු. 234, 757.53) මුදලක් වර්ෂ 2002.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපල උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක් ලක්ෂ හයසිය අසූ එකයි ශත පනස් තුනක (රු. 100,681.53) මුදලද, 2002.06.30 වන දින දක්වා පොලිය වශයෙන් එක් ලක්ෂ තිස්හතර දහස් හැත්තෑ හයක් (රු. 134,076.00) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්හතර දහස් හත්සිය පනස් හතයි හත පනස් තුනක් (රු. 234,757.53) ද,

(2) එකී රුපියල් එක් ලක්ෂ හයසිය අසූ එකයි ශත පනස් තුනක (රු. 100,681.53) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20.50%, බැගින් වන පොලියක් 2002.07.01, දිනසිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහාද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස,

### දේපළ පිළිබඳ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මහවැදිරට කෝරළේ, මඩුගම හි පිහිටි ගමගෙදර වත්ත නැමැති ඉඩම 1994.05.10 දින ඇන්ටන් සමරරත්න විසින් මැන සැකසූ අංක 1126 දරන පිඹුර ප්‍රකාර ඒ නැමැති කොටසට මායිම්

උතුරට හා නැගෙනහිරට එම ඉඩමේම කොටසක් ද දකුණට පාර ද, බස්නාහිරට එම ඉඩමේම කොටසක් හා දඹගල්ලේ ගෙදර සුදු බණ්ඩාට අයත් ඉඩම යන මායිම් තුළ පිහිටි අක්කර එකයි පර්චස් දහසයයි දශම පහ (අ.1, රූ.0,පර්. 16.5) වපසරියකින් යුතු වූ මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද සමග මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර්. 15/136 හි ලියාපදිංචි කරන ලදී.

වර්ෂ 2007 ක් වූ ජනවාරි මස 26 වන දින කොළඹදී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-325

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - හෙට්ටිවීදිය ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඉතා වටිනා දේපලක් විකිණීම

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපල 2007 ක් වූ පෙබරවාරි මස 26 වන දින පෙ. ව. 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ කොළඹ නාගරික සභා සීමාව තුල 20 වැනි නාගරික කොට්ඨාශය තුළ බෝධිරාජ මාවත දිගට (පෙර ගැස්පහ වීදිය) පිහිටි වරිපනම් අංක 220 දරන පරිශ්‍රයට බලයලත් මානක එස්. රාසප්පා විසින් සාදන ලද 2000.07.17 දිනැති අංක 182/2000 දරන පිඹුරේ ලොට් සී වයි. 1ඒ ලෙස නිරූපිත බෙදා වෙන්කර ඇති ඉඩම හා ඒ තුළ පිහිටි සියළුදේත් සමග වේ. (විශාලත්වය පර්චස් 2.81)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ඩී. සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද සී/ස හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූද 2000 ක්වූ දෙසැම්බර් මස 07 වන දින සහ 2002 ක් වූ පෙබරවාරි මස 05 වන දිනයන්හි අංක 646 සහ 742 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෙළුපිල්ලේ කුගනේෂන් ණයකරු හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය සඳහා 2006.02.10 වන දින රජයේ ගැසට් පත්‍රයද හා 2006.02.15 වන දින ඩේලිනිවුස්, දිවයින, තිනකරන් යන පුවත්පත්ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* .— විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ.

1. ගැණුම් මුදලින්10% ක්ද (සියයට දහයක්) ;
2. පළාත් සභා අය බදු සඳහා 1%ක්ද (සියයට එකයි) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% ක්ද (සියයට දෙකහමාරක්) ;
4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000 ;
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500 ;
6. සියලුම ප්‍රචාරක වියදම් ද.

ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළතදී සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත තැන්පත් කල යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න:- ප්‍රධාන කළමණාකරු (අයකිරීම් දෙපාර්තමේන්තුව), සී/ස හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815/2661816.

අයි. ඩබ්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමලුව පාර,
වටපළුව,
මහනුවර.

*දුරකථනය අංක* : 081 - 2211025, 071-4755974, 071-2755974.

*ෆැක්ස් අංකය* : 081-2211025.

02-351

---

## සීමාසහිත සෙලාන් බැංකුව - හෝමාගම ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 8 වන වගන්තිය යටතේ විකිණීමයි

#### බෙදා වෙන් කළ සීමා නිර්ණය කළ ඉඩම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, සීතාවක ප්‍රාදේශීය සභාවේ පාදුක්ක උප කාර්යාල සීමාව තුළ වග පිහිටි, අඹගහවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු සේන ඉද්දමල්ගොඩ විසින් මැන සාදන ලද 1994 දෙසැම්බර් 1 දාතම හා අංක 4686 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්නය කල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි හා සෑම සියලු දේ සමගය. ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 1. පර්. 14.2 ඉඩම).

*දේපළ පිවිසිය හැකි මාර්ගය* :- කොළඹ සිට හයිලෙවල් පාරේ (A 4)කි. මීටර් 35 ක් පමණ ගමන් කොට මීපේ හන්දියට ළඟාවී දකුණු පස ඇති පාදුක්ක පාරේ කි. මී 1.5 ක් පමණ පිංතාලිය හන්දිය දක්වා පැමිණ වම්පස ඇති හංවැල්ල/වේවැල්පනාව පාරට හැරී, එම පාරේ කි. මී. 1.8 ක් පමණ වේවැල්පනාව හන්දිය තෙක් පැමිණ, එතැනින් දකුණට හැරී වග පාරේ කි. මී. 3.3 ක් දුර ගියවිට දකුණු පස පිහිටි මෙම දේපළ හමුවේ.

සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය පරිදි ඉහත කී දේපල මා විසින් 2007 පෙබරවාරි මස 27 වැනිදා අඟහරුවාදා පෙ. ව. 11.30ට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(තුම්මෝදර, ජල්තොටගේ දොන් නන්දසිරි වික්‍රමරත්න සහ හිඳගල දොස්තර අතුල සේනාරත්න යන අය බන්ධනදායින් වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් එස්.

එස්. ද ලිවේරා විසින් ලියා සහතික කළ 1998.04.24 දාතම හා අංක 843 දරන බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයිනි). යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2002.10.11 දින රජයේ *ගැසට් පත්‍රයද*, 2002.10.03 දින ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් පුවත් පත් ද විකුණුම් නිවේදනය සඳහා 2007.02.09 දින රජයේ *ගැසට් පත්‍රයද* බලන්න.

*ගාස්තු ගෙවන පිළිවෙල .—*

1. මිල තීන්දු වූ වහාම ගැණුම් මිලෙන් 10% ක් ;
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ;

   වැඩ කරන (කාර්යාල)
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක(සියයට එකක) දේශීය අලෙවි බදු ;
4. විකුණුම් මිලෙන් 2 1/2%ක (සියයට දෙහමාරක) වෙන්දේසිකරු ගේ කොමිස් මුදල ;
5. රු.35,071.87 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමෙන් 50% ;
6. ලිපිකරු හා නිවේදක ගාස්තුව රු. 500 ;
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන කොළඹ 3, ගාලු පාරේ අංක 90 සෙලින්කෝ සෙලාන් ටවර්ස් හි 12 වන මහලේ සීමාසහිත සෙලාන් බැංකුවේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් ලබාගෙන පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථන 4-701000/2456789.

ඩන්ස්ටන් කෙලාවි.
උසාවි කොමසාරිස්, බ්‍රෝකර්, විශේෂඥ
වෙන්දේසිකරු, තක්සේරුකරු, සහ දේපළ නියෝජිත

අංක 42, දුටුගැමුණු වීදිය,
පාමංකඩ,
දෙහිවල.

*දුරකථන* : 2814742, ෆැක්ස් - 2814743, 2814744.

*ක්ෂණික ඇමතුම්* : 0772250422.

02-333

---

## සීමාසහිත සෙලාන් බැංකුව - හෝමාගම ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 8 වන වගන්තිය යටතේ විකිණීමයි

### බෙදා වෙන් කළ සීමා නිර්ණය කළ ඉඩම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ සීතාවක ප්‍රාදේශීය සභාවේ, පාදුක්ක උප කාර්යාල සීමාව ඇතුළත, වග පිහිටි අඹගහවත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු, සේන ඉද්දමල්ගොඩ විසින් මැන සාදන ලද 1994 දෙසැම්බර් 01 දාතම හා අංක 4686 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට දක්වා ඇති ඉඩම. එහි පිහිටි ගොඩනැගිලි හා සැම සියලු දේත් සමග. ප්‍රමාණයෙන් රූඩ්. 2. පර්. 24 ඉඩම)

*දේපළ පිවිසිය හැකි මාර්ගය* :- කොළඹ සිට හයිලෙවල් පාරේ (A 4) කි. මීටර් 35 ක් පමණ ගමන් කොට මීපේ හන්දියට ලගාවී දකුණු පසට විහිදෙන පාදුක්ක පාරේ කි. මී. 1.5 ක් පමණ පිංනාලිය හන්දිය දක්වා පැමිණ වම්පස ඇති හංවැල්ල/වේවැල්පනාව පාරට හැරී, එම පාර කි. මී. 1.8 ක් පමණ වේවැල්පනාව හන්දිය තෙක් පැමිණ එතැනින් දකුණට හැරී වග පාරේ කි.මී. 3.3 ක් පමණ දුර ගිය විට වම්පස පිහිටි මෙම දේපළ හමුවේ.

සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය පරිදි ඉහත කී දේපළ මා විසින් 2007 පෙබරවාරි 27 වැනිදා අඟහරුවාදා පෙ. ව. 11.00ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(තුම්මෝදර, ජල්තොටගේ දොන් නන්දසිරි වික්‍රමරත්න බන්ධනදායී වශයෙන්, ප්‍රසිද්ධ නොතාරිස් ඉනෝකා පීරිස් විසින් ලියා සහතික කළ 1997.09.15 දාතම හා අංක 120 දරන බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයිනි)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2002.10.11 දින රජයේ *ගැසට් පත්‍රයද*, 2002.01.03 දින ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් පුවත්පත් ද විකුණුම් නිවේදනය සඳහා 2007.02.09 දින රජයේ *ගැසට් පත්‍රයද* බලන්න.

*ගාස්තු ගෙවීමේ පිළිවෙල .—*

1. මිල තීන්දු වූ වහාම ගැණුම් මිලෙන් 10% ක් ;
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට වැඩ කරන (කාර්යාල) දින 30 ක් ඇතුළත ;
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක(සියයට එකක) දේශීය අලෙවි බදු ;
4. විකුණුම් මිලෙන් 2 1/2%ක (සියයට දෙහමාරක) වෙන්දේසිකරු ගේ කොමිස් මුදල ;
5. රු.35,071.87 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදමෙන් 50% ;
6. ලිපිකරු හා නිවේදක ගාස්තුව රු. 500 ;
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන කොළඹ 3, ගාලු පාරේ අංක 90 සෙලින්කෝ සෙලාන් ටවර්ස් හි 12 වන මහලේ සීමාසහිත සෙලාන් බැංකුවේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති දෙපාර්තමේන්තුව) වෙතින් ලබාගෙන පරීක්ෂා කර බැලිය හැකිය. දුරකථන 4-701000/2456789.

ඩන්ස්ටන් කෙලාවි.
උසාවි කොමසාරිස්, බ්‍රෝකර්, විශේෂඥ
වෙන්දේසිකරු, තක්සේරුකරු, සහ දේපළ නියෝජිත.

අංක 42, දුටුගැමුණු වීදිය,
පාමංකඩ,
දෙහිවල.

දුරකථන : 2814742, ෆැක්ස් - 2814743, 2814744.

ක්ෂණික ඇමතුම් : 0772250422.

02-335

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.